# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

## ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2009
## 2010 ඔක්තෝබර්

## BMGT E 1035 – ව්‍යාපාරික ආර්ථික විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

**(ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු ලැබේ)**

පළමු කොටසෙන් ප්‍රශ්න තුනක්ද (03) දෙවන කොටසෙන් ප්‍රශ්න දෙකක්ද (02) ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

### <u>පළමු කොටස</u>

(01) (අ) "ව්‍යාපාරික ආර්ථිකවිද්‍යාව තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහ අනාගත සැලසුම් සැකසීමට කළමනාකරුවන්ට උපකාරී වේ". සංවිධානයක තීරණ ගැනීමේ ක්‍රියාවලියට ව්‍යාපාරික ආර්ථිකවිද්‍යාව සහාය වන්නේ කවර ආකාරයෙන්ද?

(ලකුණු 05)

(ආ) "ආර්ථික විචල්‍යයන් අතර සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම සඳහා ගතික විශ්ලේෂණය මෙන්ම ස්ථිතික විශ්ලේෂණයද එක හා සමානව වැදගත් වේ". මෙය උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ) තරගකාරී වෙළඳපලක අලෙවිවන භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිතයන් පහතින් දක්වා ඇත.

$$QD = 10 - P$$

$$QS = -2 + 2P$$

(i) ඉල්ලම් වක්‍රය හා සැපයුම් වක්‍රය ප්‍රස්ථාරයක නිර්මාණය කර සමතුලිතය දක්වන්න.

(ලකුණු 03)

(ii) සමතුලිතයේදී මෙම භාණ්ඩයේ මුළු පාරිභෝගික පැහැදුම ගණනය කරන්න.

(ලකුණු 02)

(iii) පවතින ලෝක වෙළඳපොළ මිල යටතේ රු. 3.00 කට මෙම භාණ්ඩය ආනයනය කළ හැකියැයි උපකල්පනය කරන්න. ඒ අනුව මෙම භාණ්ඩයේ නව පාරිභෝගික පැහැදුම කීයද? භාණ්ඩයේ ආයාත පැහැදුම කියද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(02) (අ) "පාරිභෝගිකයකු භාණ්ඩ ඒකකයක් හෝ සේවාවක් වෙනුවෙන් වටිනාකමක් නියම කරනුයේ එයින් ඔහුට ලැබෙන උපයෝගිතාවය පදනම් කර ගනිමිනි". උපයෝගීතාවය මැනීම මත පදනම්ව ඔබ විසින් හඳුනාගනු ලැබූ එකිනෙකට වෙනස් ප්‍රවේශයන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) පහත තොරතුරු ආශ්‍රයෙන් පාරිභෝගිකයකු තම තෘප්තිය උපරිම කෙරෙන ප්‍රශස්ථ භාණ්ඩ සංයෝගය ගණනය කරන්න.

X භාණ්ඩයේ මිල = රු. 10.00

Y භාණ්ඩයේ මිල = රු. 6.00

මුළු ආදායම = රු. 86.00

| Q | MUx | MUy |
|---|---|---|
| 1 | 40 | 45 |
| 2 | 45 | 30 |
| 3 | 35 | 20 |
| 4 | 20 | 15 |
| 5 | 10 | 10 |
| 6 | 7 | 6 |
| 7 | 3 | 3 |
| 8 | 0 | 0 |

(ලකුණු 05)

(ඇ) සුදුසු ප්‍රස්ථාර සටහන් ආශ්‍රයෙන් උපේක්ෂා වක්‍ර විශ්ලේෂණය ඉල්ලුම් න්‍යායට පදනම් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(03) (අ) නිෂ්පාදකයකු දිගු කාලයේදී අත්විඳින මහා පරිමාණික වාසි හා මහා පරිමාණික අවාසි මොනවාදැයි දක්වන්න.

(ලකුණු 05)

(ආ) "සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) හා සාමාන්‍ය පිරිවැය වක්‍රයන් (AC) ක්‍රමයෙන් එකිනෙකට සමීප වන නමුත් ඒවා කිසිවිටක එකිනෙක ඡේදනය නොවේ" ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නෙහිද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ) නිෂ්පාදන න්‍යාය ආශ්‍රයෙන් නිෂ්පාදන සමතුලිතය පැහැදිලි කරන්න. නිෂ්පාදන සමතුලිත කොන්දේසි මොනවාද?

(ලකුණු 04)

(ඈ) විවිධ නිෂ්පාදන අදියරයන් අතුරින් තාර්කික නිෂ්පාදකයෙකු තම ප්‍රශස්ථ නිෂ්පාදන අදියර ලෙස තෝරාගනු ලබන්නේ කුමන අදියරද? මෙම අදියරේදී මුළු ඵලදායීතා වක්‍රය (TP), සාමාන්‍ය ඵලදායීතා වක්‍රය (AP) හා ආන්තික ඵලදායිතා වක්‍රයන්ගේ (MP) හැසිරීම කවර ස්වරූපයක් ගනීදැයි විස්තර කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

(04) (අ) තරගකාරිත්වයේ තීව්‍රතාවය මත පදනම්ව සියළුම වෙළඳපොළ ව්‍යුහයන් පූර්ණතරගකාරී වෙළඳපොළින් ආරම්භ කර පෙළගස්වන්න. ඉහත ආකාරයට පෙළ ගැස්වීමෙන් පසු එකිනෙක වෙළඳපළ අතර පවත්නා ගති ලක්ෂණයන් සංසන්දනය කරන්න.

(ලකුණු 08)

(ආ) "පූර්ණ තරඟකාරී වෙළඳපලක පවතින ආයතන හා ඒකාධිකාරී වෙළඳපොළක පවතින ආයතන දිගු කාලයේදී ලාභ උපරිම කරන නිමවුම් මට්ටමෙහි පැහැදිලි වෙනසක් දක්නට ලැබේ." ඉහත ප්‍රකාශය පිළිබඳව ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

(ලකුණු 06)

(ඇ) එක්තරා ආර්ථිකයකට අදාලව මිල ශ්‍රිතය හා සාමාන්‍ය පිරිවැය පහතින් දක්වා ඇත.

$$AC = \frac{100}{Q} + 60 + 40$$

$$P = 500 - 5Q$$

(i) ලාභය උපරිම කරන මිල හා නිමවුම් මට්ටම ගණනය කරන්න.

(ii) මෙම උපරිමයේදි ලාභය සොයන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

(5) (අ) ඒකාධිකාරී තරඟ වෙළඳපොළ ආයතනයක දිගුකාලීන ඉල්ලුම් වක්‍රය, කෙටිකාලින ඉල්ලුම් වක්‍රයට සාපේක්ෂව වඩා නම්‍ය ස්වරූපයක් ගන්නේ මන්ද? හේතු දක්වන්න

(ලකුණු 04)

(ආ) "ඒකාධිකාරී තරඟ කරුවකු කෙටි කාලිනව අධිප්‍රාමාණික ලාභ ලැබුවද ඔහු / ඇය දිගුකාලයේදී සාමාන්‍ය ලාභ උපයන්නකු බවට පත්වේ." ප්‍රස්ථාර අනුසාරයෙන් විශ්ලේෂණය කරන්න

(ලකුණු 05)

(ඇ) අනෙකුත් වෙළඳපොලවල් හා සසඳන කළ කතිපයාධිකාරී වෙළඳ පොළක කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?

(ලකුණු 03)

(ඈ) "පූර්ණ තරඟකරුවන් හෝ මිල ගනුවන් එහි ආන්තික පිරිවැය මිලට සමාන වන අවස්ථාවේදී මෙන්, මිල නායකත්වයේදීද බලවත් ආයතනයේ මිල එහි අනුගාමික ආයතන විසින් අනුගමනය කරන අතර එම අනුගාමිකයන් දිගු කාලයේදි සමච්ඡේදනය ලක්ෂය වෙතට ගමන් කරයි". මෙම ප්‍රකාශය සත්‍යද? අසත්‍යද? පැහැදිලි කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

## දෙවන කොටස

(6) එක්තරා ආර්ථිකයකට අදාලව පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත. (වටිනාකම් රුපියල් මිලියන වලිනි.)

| | | |
|---|---|---|
| $C = 60 + 0.4Y$ | (පාරිභෝජනය) |
| $I = 350$ | (ආයෝජන) |
| $X = 200$ | (නිර්යාත) |
| $TX = 40 + 0.3Y$ | (බදු ශ්‍රිතය) |
| $G = 250$ | (රාජ්‍ය වියදම්) |
| $M = 60 + 0.14Y$ | (ආයාත) |

(අ) දෙන ලද තොරතුරු උපයෝගී කර ගනිමින් සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 06)

(ආ) ආයාත ශ්‍රිතය $M = 80 + 0.24Y$ ලෙස වෙනස් වූයේ නම් නව සමතුලිත ජාතික ආදායම කොපමණද?

(ලකුණු 04)

(ඇ) ගුණකය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? මෙම ආර්ථිකයේ වියදම් ගුණකය ගණනය කරන්න.

(ලකුණු 05)

(ඈ) "සෘජු බදු ආදායමේ (Lum Sum Tax) හා රාජ්‍ය වියදමෙහි එක හා සමාන වූ ඉහළ යාමක් E=Y ප්‍රස්ථාර සටහනෙහි මුළු වියදම් වක්‍රය ඉහළ නැංවීමකට මඟ පාදයි" මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද? කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

(07) (අ) නව ආයෝජනයන් දිරි ගැන්වීමේ අදහසින් රජය විසින් පෞද්ගලික ව්‍යවසායකයන්ට සහනාධාරයන් ප්‍රධානය කලේයැයි උපකල්පනය කරන්න. මෙම නව රාජ්‍ය ප්‍රතිපත්තිය ස්වායත්ත ආයෝජනයන් ඉහළ නැංවීම කෙරෙහි බලපා ඇති ආකාරය "තෙරපුම් ප්‍රතිවිපාක" සංකල්පය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(ආ) රජය විසින් අයවැය හිඟය පියවීම සඳහා ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කලේනම්, ආයෝජන අනුපාතිකයේ, ජාතික ආදායමේ සහ පොදු මිල මට්ටමේ දැකිය හැකි වෙනස්කම් මොනවාද? ඔබගේ පිළිතුර ප්‍රස්ථාර උපයෝගී කරගනිමින් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 06)

(ඇ) පහත දක්වෙන ආර්ථික ආකෘතිය සැලකිල්ලට ගන්න.

| | | | |
|---|---|---|---|
| C | = | 70 + 0.8yd | (පාරිභෝජනය) |
| I | = | 100-90r | (ආයෝජනය) |
| Tx | = | 35+ 0.2y | (බදු ) |
| Tr | = | 40 | (සංක්‍රාම) |
| Md | = | 0.25y- 200r | (මුදල් ඉල්ලුම) |
| $\frac{Ms}{P}$ | = | 140 | (මුදල් සැපයුම) |

සමතුලිත ජාතික ආදායම සහ සමතුලිත පොලී අනුපාතිකය ගණනය කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

(08) (අ) මෑත කාලීනව උද්ගත වූ මූල්‍ය අර්බුදය ශ්‍රී ලංකා සේවා නියුක්තිය කෙරෙහි ඇතිකල බලපෑම් මොනවාද?

(ලකුණු 08)

(ආ) "සංවර්ධනය වන රටවල දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ආර්ථික වර්ධනය අවශ්‍ය වන සාධකයක් වුවද ප්‍රමාණවත් සාධකයක් නොවන්නේය". පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ඇ) ප්‍රායෝගිකව සෑම උද්ධමන ක්‍රියාවලියක්ම ඉල්ලුමෙන් ඇදෙන හා පිරිවැයෙන් තල්ලුවන බලවේගවල සම්මිශ්‍රණයකි. ඔබ එකඟ වන්නේද? සාකච්ඡා කරන්න

(ලකුණු 05)
(මුළු ලකුණු 20)